# ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ අතීත වැඩිහිටි මානවයා පිළිබඳ මෙන් ම එකල වූ ළමා පරපුර පිළිබඳව ද අවදානය යොමු කරන්නේ නම් ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ ගමන්මග කෙබඳු වේද?

අයි. ඩී. වී. තිනේෂා කරුණාරත්න*

ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය තව තවත් පුළුල් කිරීම උදෙසා අතීතය පිළිබඳ සාධක සෙවීමට අතීතයේ වැඩිහිටි මානවයා සමඟ විසූ ළමා පරපුර වෙත ද අවදානය යොමුකළ හැකි බව පෙන්වීම මෙහි අරමුණ වන අතර ලිඛිතමය මූලාශ්‍ර, පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර හා අන්තර්ජාලය භාවිතා කිරීම මෙහි ක්‍රමවේදය ලෙස භාවිතා කර ඇත. පුරාවිද්‍යා පර්යේෂණයන් දී කැණීමක්, ගවේෂණයක් වූ මේ ඕනෑම අවස්ථාවක දී ක්ෂේත්‍රයෙන් සොයාගන්නා සාධක අතරින් වැඩි අවදානයක් වැඩිහිටි මානව සාධක පිළිබඳ දැක්වීමෙහි ලා පුරාවිද්‍යාඥයින් අවදානය යොමුකරනු ලබයි. නමුත් වර්තමානයේ දී ද කුටුම්භයක්, සමාජයක් ගත් කළ එහි වැඩිහිටියන් විසින් ආරක්ෂාව, රැකවරණය, පෝෂණය කිරීම් ආදියේ දී තම දරුවන් පිළිබඳ මූලික අවදානයක් යොමු කරනු ලබයි. ඔවුන්ගේ අධ්‍යාපන රටා හා ජීවන රටා පිළිබඳ තම මූලික අවදානය යොමුකරයි. එසේ නම්, වර්තමානය අතීතය තුළින් ගොඩනැගෙන්නේ නම් අතීතයේ මානවයා ද වත්මන් මානවයා මෙන් තම දරුවන් පිළිබඳ ව මේ අයුරින් ම සොයා බලන්නට ඇත් ද? ඔවුන් ද තම මූලික අවදානය තම දරුවන් වෙත යොමුකරන්නට ඇත් ද? එසේ සිදුවූයේ නම් එය අප අවදානයට යොමුවිය යුතු කරුණක් නොවන්නේ ද? ආදී ප්‍රශ්න ගණනාවකට මෙහිදී කරුණු ඉදිරිපත් කරන අතර අතීත මානව චර්යා රටා, ආහාර පාන ආදී සියල්ලක්ම පාහේ වැඩිහිටි මානවයා ආශ්‍රිත ව පමණක් නොව ඔවුන්ගේ දරුවන්ගේ ක්‍රියාකලාප ආශ්‍රිතව ද අප අවදානය යොමු කරන්නේ නම් ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය කෙබඳු වේද යන්න මෙහිදී සාකච්ඡා කරනු ලබයි. ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාවේ නිගමනයන් ලබා ගැනීමේ දී අතීත වැඩිහිටි මානවයා මෙන් ම එකල වූ ළමා පරපුර පිළිබඳව ද අවදානය යොමුකළ හැකි අතර එමගින් ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය තව තවත් දියුණු කර වෙනස් ම මඟකට ගමන් කළ හැකි බව අවසන නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ- ප්‍රාග් ඓතිහාසික, පුරාවිද්‍යාව, මානවයා, ළමා පරපුර, වැඩිහිටි මානවයා

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය